# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 ජූලි

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 ජූලි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 66.7%ක් බව එහි වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 ජූනි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 58.9%ක් ලෙස වාර්තා විය. 2022 ජූලි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 39.3%ක හා ආහාර නොවන කාණ්ඩයේ 27.4%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 ජූලි මාසයේ 6.8%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.1%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.7%ක් විය. 2021 ජූලි මාසයට සාපේක්ෂව 2022 ජූලි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 ජූනි මාසයේදී 75.8% සිට 2022 ජූලි මාසයේදී 82.5% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 ජූනි මාසයේදී 43.6% සිට 2022 ජූලි මාසයේදී 52.4% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 ජූනි මාසයේ 231.5ක් වූ දර්ශකාංකය 2022 ජූලි මාසයේ 244.4ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 ජූලි මාසයේ දර්ශකාංකය 12.9ක වැඩිවීමක් එනම් 5.6ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 2.4%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 3.2%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට  කිරිපිටි, සහල්, අළුත් මාළු, බිස්කට් වර්ග, කුකුළුමස්, කරවල, පාන්, සීනි, මිරිස්කුඩු, පළතුරු, අර්තාපල්, ළදරු කිරිපිටි, ටින්මාළු, වියළි මිරිස්, හරක්මස්, අමුමිරිස්, තුනපහ කුඩු, බිනිස් සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. තවද එළවළු, පොල්තෙල්, පොල්, ලොකුළුෑණු, රතුළුෑණු සහ දෙහි මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 ජූලි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(බුලත්)*, ‘රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සහ දර මිලදී ගැනීම)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' (*සබන් වර්ග*), 'සෞඛ්‍ය' (පෞද්ගලික වෛද්‍ය ගාස්තු), 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල් සහ බස් ගාස්තු)*, 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' (අභ්‍යාස පොත් සහ ලිපි ද්‍රව්‍ය), ' *අධ්‍යාපන*' (අමතර පන්ති ගාස්තු), 'ආපනශාලා සහ හෝටල්' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' (*සුවඳ සබන් වර්ග*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 ජූනි මාසයේ 49.3% සිට 2022 ජූලි මාසයේ 57.3% දක්වා වැඩිවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | ජූලි | 146.6 | 158.5 | 137.2 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 11.0 | 3.2 | 4.4 |
| | අගෝ. | 147.1 | 159.4 | 137.4 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 11.1 | 3.0 | 4.7 |
| | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |
| | අප්‍රේල් | 190.3 | 218.8 | 167.9 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 45.1 | 23.9 | 27.9 |
| | මැයි | 208.7 | 242.2 | 182.4 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 58.0 | 34.2 | 37.7 |
| | ජූනි | 231.5 | 276.6 | 196.0 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 75.8 | 43.6 | 49.3 |
| | ජූලි | 244.4 | 289.3 | 209.1 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 82.5 | 52.4 | 57.3 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව